**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**
**Sabaragamuwa Provincial Department of Education**

**පළමු වාර පරික්ෂණය 2018** | **11 ශ්‍රේණිය**
**முதலாம் தவணைப் பரீட்சை 2018** | **தரம் 11**
**First Term Test 2018** | **Grade 11**

***චිත්‍ර - I***
***Art - I***

***පැය 1 යි***
***1 Hour***

**නම/විභාග අංකයඃ-** ....................................................................................................................................................

- **සියළුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- **පහත දැක්වෙන කලා කෘතිය හඳුනා ගෙන ප්‍රශ්න අංක 1 සිට 5 දක්වා ප්‍රශ්න වලට අදාල පිළිතුරු තිත් ඉර මත ලියන්න**



ඉහත ඡායාරූපයෙන් දැක්වෙන්නේ (01) ........................................................................ පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටා ඇති (2) ............................................................ යයි. අනුරාධපුර යුගයේ (3) ........................... .................... සියවසට අයත් , මෙය (04) ............................................... රජතුමාගේ කාලයේ නිර්මාණය කරන ලද්දකි. මෙහි ඇති සිතුවම් අතර (05) ........................................................ රූප පන්සියයක් තිබුණ බව සඳහන් ය.

- **අංක 6 සිට 10 දක්වා අදාල ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

(06) අනුරාධපුර යුගයට අයත් තොළුවිල බුදු පිළිමය ............................................... සම්ප්‍රදායේ ලක්ෂණ ප්‍රකට වන බව විද්වතුන්ගේ මතය වී තිබේ.

(07) සංකස්සපුර දේවාරාධනාය හෙවත් සංකස්සපුරයට වැඩීම නැමති චිත්‍රය පොළොන්නරුවේ .................................... ඇඳ ඇති සිතුවමකි.

(08) පැබ්ලෝ පිකාසෝ ශිල්පියා විසින් නිර්මාණය කරන ලද යුද්ධයේ බිහිසුණු බව දැක්වෙන ප්‍රබල හා විශිෂ්ඨතම නිර්මාණය ලෙස ..................................................................... සිතුවම හඳුනවා දිය හැක.

(09) කොළඹ කලාභවනේ නිත්‍ය ප්‍රදර්ශනයට තබා ඇති 'යකදුරාගේ දියණිය' නම් සිතුවම ............................................ ශිල්පියා විසින් නිර්මාණය කරන ලද්දකි.

(10) ජී.එස්. ප්‍රනාන්දු ශිල්පියා විසින් ඇඳ ඇති 'උළු පෝරුණුව' නැමති සිතුවම .............................................................. මාධ්‍යයෙන් ඇඳ ඇත.

❖ ප්‍රශ්න 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුර සැපයීම සඳහා පහත රූප සටහන් යොදා ගන්න.



i



ii



iii



iv



v

(11) අංක i රූපයෙන් නිරූපිත එම්. සාර්ලිස් මහතා විසින් අඳින ලද සිදුහත් කුමරු හා මව් බිසව සිතුවමින් කුමන කලා ශෛලියක් නිරූපණය වේ ද? ..............................................................................................................................

(12) අංක ii රූප සටහනින් නිරූපණය වන ජෝර්ජ් කීට් ශිල්පියා විසින් අඳින ලද මෙම චිත්‍රය කුමන නමකින් හඳුන්වයි ද?

..............................................................................................................................

(13) අංක iii රූප සටහනින් නිරූපනය වන ලියනාඩෝ ඩාවින්සි ශිල්පියා විසින් අඳින ලද මෙම තෙල් සායම් චිත්‍රය අඳිනු ලැබ ඇත්තේ කුමක ද? ..............................................................................................................................

(14) අංක iv රූප සටහනින් නිරූපිත 'කුරුළු දඩයම' නැමති මෙම ඊජිප්තු සිතුවම ඇඳ තිබුණු සොහොන් ගැබේ නම කුමක් ද? ..............................................................................................................................

(15) අංක v රූප සටහනින් නිරූපනය වන මැඩෝනා ඩෙලා සේදියා වන නම් චිත්‍රය නිර්මාණය කරන ලද ශිල්පියා නම් කරන්න. ..............................................................................................................................

❖ ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් දී ඇති වචන වල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.

(16) කියාරොස්කුරෝ :- ..............................................................................................................................

(17) අඛණ්ඩ කථන මාධ්‍ය :- ..............................................................................................................................

(18) පර්යාලෝකය :- ..............................................................................................................................

(19) ලැපිස් ලසුලි :- ..............................................................................................................................

(20) සංගත වර්ණ :- ..............................................................................................................................

❖ **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(21) අවසාන රාත්‍රී භෝජන සංග්‍රහය නැමති සිතුවම අඳිනු ලැබුවේ,
1. ලියනාඩෝ ඩාවින්සි. 2. ජෝර්ජ් බ්‍රාක්. 3. රෆායල් සෙන්සියෝ. 4. මයිකල් ආන්ජිලෝ.

(22) සද්ධර්මතිලක විහාරය නමින් හඳුන්වනු ලබන්නේ,
1. පොළොන්නරුවේ ලංකාතිලක විහාරය. 2. ගඩලාදෙනි විහාරය.
3. පොළොන්නරුවේ තිවංක පිළිමගෙය. 4. දෙගල්දොරුව රජ මහාවිහාරය.

(23) ''කුඹල් හල'' නැමති තෙල්සායම් චිත්‍රය අඳිනු ලැබුවේ,
1. ඒ.සී.ජී.එස්. අමරසේකර ශිල්පියා. 2. ස්ටැන්ලි අබේසිංහ ශිල්පියා
3. ජෝර්ජ් කීට් ශිල්පියා 4. ඩේවිඩ් පේන්ටර් ශිල්පියා.

(24) පහත ශිල්පීන් අතුරින් පුවත්පත් කාටූන් ශිල්පියෙක් නොවන්නේ ,
1. ඔබ්රි කොලට් 2. සොයිලියස් මෙන්ඩිස්. 3. ජෙෆ්රි යූනුස් 4. ඩබ්.ආර්.විජේසෝම

(25) ස්පාඤ්ඤයේ බාසිලෝනා නගරයේ ජීවත් වූ වීදි ස්ත්‍රීන් නිරූපිත පැබ්ලෝ පිකාසෝ විසින් අඳිනු ලැබූ ප්‍රසිද්ධ චිත්‍රය වන්නේ,
1. ලක්ෂ්මිගේ උපත. 2. අවිග්නොන්හි යුවතියෝ 3. නායිකා 4. බාල තරුණ

❖ **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් ( √ ) ලකුණ ද වැරදි නම් වැරදි ( × ) ලකුණ ද ඉදිරියෙන් ඇති තිත් ඉර මත යොදන්න.**

(26) යහපත් සමරිතානුවරයා නම් චිත්‍රය ඇද ඇත්තේ මහනුවර ත්‍රිත්ව දෙව් මැඳුරේය. (...........)

(27) ඇතැන්ස් ගුරුකුලය නැමති චිත්‍රය ලූවර් කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇත. (...........)

(28) විජයොත්පාය නම් ගෘහ නිර්මාණය ගඩලාදෙනි විහාරයේ දක ගත හැකිය. (...........)

(29) පන්කුලියේ බුදුපිළිමය පොළොන්නරු යුගයේ දී නිර්මාණය කරන ලද්දකි. (...........)

(30) ඇම්බැක්ක දේවාලෙයේ ලී කැටයම් දෙල්මඩ මූලාචාරීන් විසින් නිමකරන ලදැයි සැලකේ. (...........)

❖ **අංක 31 සිට 35 දක්වා කෙටි පිළිතුරු සපයන්න.**

(31) ළඟ ඇති වස්තූන් තද පැහැයෙනුත් ඈත ඇති වස්තූන් ලා පැහැයෙනුත් වර්ණ කර දක්වීම කුමන නමකින් හඳුන්වයි ද?
.................................................................................................................................................

(32) පෝස්ටර් චිත්‍රයකින් දැනවිය යුතු මූලිකාංගය කුමක් ද? ...........................................................................

(33) දියසායම් මාධ්‍යයෙන් අඳිනු ලැබූ චිත්‍රයක දැකිය හැකි සුවිශේෂී ලක්ෂණය කුමක්ද? ..................................................

(34) කුඩා දරුවන්ට සිතුවම් වර්ණ ගැනවීම සඳහා වඩාත් සුදුසු වන වර්ණ මාධ්‍ය කුමක් ද? .......................................

(35) මහනුවර යුගයට අයත් චිත්‍රයක් ඇසුරින් බිතු සැරසිල්ලක් නිර්මාණය කළහොත් එහි පසුතලයට යෙදිය යුතු වර්ණය කුමක් ද ? .................................................................................................

❖ **ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා ඇති ප්‍රශ්නවලට රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.**



(36) හඳුනාගත්බව :- ........................................................................................................................................................

(37) යුගය :- ........................................................................................................................................................

(38) මුද්‍රාව :- ........................................................................................................................................................

(39) සම්ප්‍රදාය :- ........................................................................................................................................................

(40) කලා ලක්ෂණ :- ........................................................................................................................................................